මීනුවන්ගොඩ නගර සභාව - 2024
----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 අහිතකර මතය

මීනුවන්ගොඩ නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට මීනුවන්ගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අහිතකර මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රමිතියේ 3 පරිච්ඡේදයේ 3.28 ඡේදය අනුව මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී විස්තීර්ණ අදායම් ප්‍රකාශයේ අතිරිත්තය වූ රු.5,741,146 ක් වෙනුවට රු.9,880,437 ක් ලෙස රු.4,139,291 ක් වැඩියෙන්ද, සමාලෝචිත වර්ෂයේ ක්ෂය වටිනාකම රු.19, 134,640 ක් වුවත් එය රු.14,586,519 ක් ලෙස රු.4,548,121 ක් අඩුවෙන්ද සහ කාරක ප්‍රාග්ධනය ගැලපීමේ දී අවසන් තොග වටිනාකම් වෙනස රු.131,601 ක් වුවද එය රු.7,551,410 ක් ලෙස රු.7,419,809 ක් වැඩියෙන් ද ගලපා තිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායමට ගලපන ලද ආයෝජන පොළී ආදායම රු.5,581,172 ක් අතිරික්තයෙන් අඩුකර දක්වා නොතිබුණි.	නිවැරදි කරන බව.	ප්‍රමිතිය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය.
(ආ)	ප්‍රමිතියේ 3 පරිච්ඡේදයේ 3.29 ඡේදය අනුව අයෝජන ක්‍රියාකාරකම්වලින් ලත් මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 15 අනුව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ස්ථාවර තැන්පතු පොලිය සමඟ ස්ථාවර තැන්පතු වටිනාකම රු.36,808,404 කින් ඉහළගොස් තිබුණද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පොලි ලැබීම් හෝ නැවත ආයෝජන ආයෝජන ක්‍රියාකාරකම්වලින් වන මුදල් ප්‍රවාහ යටතේ දක්වා නොතිබුණි.	සංශෝධිත මුදල් ප්‍රවාහ ප්‍රකාශය මගින් නිවැරදි කර ඇති බව.	ප්‍රමිතිය අනුව මුදල් ප්‍රවාහය පිළියෙල කළ යුතුය.
(ඇ)	ප්‍රමිතියේ 9 වන පර්ච්ඡේදය හා එහි පරිශිෂ්ඨය 2 අනුව පුනරාවර්ථනය නොවන වියදම් සඳහා රජයෙන් ලැබෙන මාරුකිරීම් ගිණුම්ගත කිරීමේදී ප්‍රමිතියේ 9.5 අනුව ක්ෂය කිරිම් ගණනය කරන ආකාරයට වියදම් හඳුනාගන්නා කාල පරිච්ඡේදයේ අයහාරය හඳුනාගත යුතු වුවද ඒ අනුව හඳුනාගෙන නොතිබුණි.	සංශෝධිත මුදල් ප්‍රවාහ ප්‍රකාශය මගින් නිවැරදි කර ඇති බව.	ප්‍රමිතිය අනුව මුදල් ප්‍රවාහය පිළියෙල කළ යුතුය.

(ඇ)	මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල වර්ෂයේ මුදල් හා මුදල් සමාන දෑ ශුද්ධ ගලායාම රු.12,829,068 ක් වියයුතු වුවද එය රු.21,898,691 ක් ලෙස රු. 9,069,623 ක් වැඩියෙන් දක්වා තිබුණි.	සංශෝධිත මුදල් ප්‍රවාහ ප්‍රකාශය මගින් නිවැරදි කර ඇති බව.	ප්‍රමිතිය අනුව මුදල් ප්‍රවාහය පිළියෙල කළ යුතුය.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයට අදාළ පොලී ආදායම රු.4,916,097 ක් වුවද එය රු.6,121,572 ක් ලෙස රු.1,205,475 ක් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි.	සංශෝධිත විස්තීර්ණ ආදායම් ප්‍රකාශය මගින් නිවැරදි කර ඇති බව.	නිවැරදිව වටිනාකම් හදුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ සමුච්චිත අරමුදලේ ශේෂය හා ලෙජරය අනුව ශේෂය අතර රු.18,301,361 ක වෙනසක් පැවතුණි.	සංශෝධිත ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය මගින් නිවැරදි කර ඇති බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(ඇ)	ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලිය රු.1,423,240 ක් වුවද එය රු.2,629,215 ක් ලෙස රු.1,205,475 ක් වැඩියෙන් දක්වා තිබුණි.	වත්කම් වගකීම් ප්‍රකාශය මගින් නිවැරදි කර ඇති බව.	වටිනාකම් නිවැරදි හදුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුමේ පැවති බැංකු ගිණුමට සෘජුවම බැර කර තිබූ මුදල් තැන්පතු රු.2,725,113 ක්, වැටුප් ප්‍රතිපූර්ණ රු.4,548,993 ක් , ස්ථාවර තැන්පත් පොලී රු.107,129 ක් , සූර්යබල විදුලි ජනන ආදායම් රු.123,351 ක් සහ මුද්දර ගාස්තු රු.4,594,710 ක් ලෙස එකතුව රු.12,099,296 ක් ගිණුම්ගත කර නොතිබුණි.	2025 වර්ෂයේ ආදායම් ගිණුමට ඇතුලත් කරන බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂය තුළ සේවා සපයනු ලබන වටිනාකම රු. 6,679,550 ක් වූ සූර්ය පැනල පද්ධතිය වත්කම් යටතේ හඳුනා නොගෙන කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණු අතර දෙසැම්බර් මස මුදලින් ලද රු.123,351 ක් හා කාර්යාල බිල්පතට හිලව් කරන ලද ඒකක ගණනට අදාල අගය ආදායම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.	2025 වර්ෂයේ වත්කම් ලෙස ගිණුම්ගත කර ආදායමට ගන්නා බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.

1.6.3 නොසැසඳුණු පාලන ගිණුම්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් ශේෂ 05 ක මූල්‍ය ප්‍රකාශන එකතු වටිනාකම හා උපලේඛන අනුව එකතු වටිනාකම අතර රු.69,431,063 ක වෙනසක් පැවතුණි.	උපලේඛන නිවැරදි නොවන බව.	උපලේඛන යාවත්කාලීනව පවත්වා ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.

1.6.4 අවිනිශ්චිත ගිණුම්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශයේ ශුද්ධ වත්කම් රු.1,570,007,868 ක් සහ ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ රු.1,496,425,357 ක් ලෙස දැක්වීමෙන් වත්කම් හා වගකීම් ප්‍රකාශයේ රු.73,582,511 ක අවිනිශ්චිත ශේෂයක් විය.	නිවැරදි කර ඉදිරිපත් කර ඇති බව.	ගිණුම්ගත කිරීම් නිවැරදිව සිදු කළ යුතුය.

1.6.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
විස්තරාත්මක උප ලේඛණ ඉදිරිපත් නොකිරීම නිසා සටහන් 10 අනුව ප්‍රග්ධන වියදම් දිමනා ශේෂය රු.107,058,687 ක් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.	නිවැරදි කර ඉදිරිපත් කර ඇති බව.	උපලේඛන නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	නගර සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති			

(i) 312(V)	සභාව විසින් ශාරිරීක යෝග්‍යතා මධ්‍යස්ථානය ටෙන්ඩර් කිරීමේදී පුවත්පත් දැන්වීම් පළ කිරීමේදී ශාරිරීක යෝග්‍යතා මධ්‍යස්ථානය උපකරණ සහිතවද රහිතවද යන්න නිශ්චිතව දක්වා නොතිබීමෙන් ඒ පිළිබද උනන්දුවක් දක්වන පාර්ශවයන් හට සියලු තොරතුරු දැනගැනීමට නොහැකි වී තිබුණි. ඒ අනුව නිසි සැලසුමකින් තොරව ටෙන්ඩර් දැන්වීම් පළ කිරීම තුලින් නැවත වරක් ටෙන්ඩර් දැන්වීම් පළ කිරීමට සිදුවී තිබුණි.	දෙවන වර නිවැරදිව ලංසු කැඳවූ බව.	ගිණුම් කටයුතු පිළිබඳ රීතීන්හි යොමුගත රීතිය අනුව කටයුතු කළ යුතුය.
(ii) 395	දේපල සම්බන්ධයෙන් වරලත් තක්සේරුකරුවෙකුගේ තක්සේරු වාර්තාවක් ලබානොගෙන සභාව විසින් දේපල 21 සඳහා ලංසු වටිනාකම් තක්සේරු කර තිබුණි.	වරලත් තක්සේරුකරුව කුගෙන් තක්සේරුවක් ලබාගැනීමට ලිපියක් ඉදිරිපත් කර ඇති බව.	දේපල සඳහා වරලත් තක්සේරුකරු වෙකුගේ තක්සේරු වාර්තාවක් පදනම්ව ලංසු වටිනාකම් තීරණය කළ යුතුය.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.5,741,146 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.13,239,491 ක් විය.

2.2 **මූල්‍ය පාලනය**

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කුවිතාන්සියක් නිකුත් කර මුදල් පොතට සටහන් නොකිරීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු ලැබීම් රු.4,594,710 ක් භාවිතයට ගැනීමෙන් හෝ ආයෝජනය කිරීමකින් තොරව නිෂ්කාර්යව පවත්වාගෙන ගොස් තිබුණි.	ඉදිරියේදී එවැනි මගහැරීම් සිදු නොවීමට කටයුතු කරන බව.	නිෂ්කාර්යව පැවති කාළයට අදාලව සභා අරමුදලට වූ අලාභය නිශ්චය කර අයකර ගැනීමට හා ඉදිරියේදී භාවිතයට ගැනීමට හෝ ආයෝජන කිරීමට කටයුතු කළ යුතුය.

(ආ)	වැටුප් ප්‍රතිපූර්ණ මුදල් ද බැංකුවට බැරවී ඇතිබව හඳුනාගත්තද මුදල් පොතට නොගෙන දීර්ඝ කාලයක් ඉදිරියට ගෙන එන බව නිරීක්ෂණය විය. ඒ අනුව රු. මිලියන 4.6 ක සිට 23.3 ක මුදලක් 2024 වර්ෂය පුරාවට ආයෝජනය කිරීමකින් තොරව නිෂ්කාර්යව පවත්වාගෙන ගොස් තිබුණි.	ආදායමට ගෙන නිවැරදි කරන බව.	මහජන මුදල් උපරිම කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජන යට ක්‍රියා කළ යුතුය. ආයෝජන කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2019 වර්ෂයේදී ගින්නෙන් විනාශවූ කඩහිමියන් විසින් තැන්පත් කළ ලෙස අනුමාන කරනු ලබන මුත් තැන්පත්කරුවන් නිශ්චිතව හඳුනා නොගත් තැන්පතු වටිනාකම 2024 දෙසැම්බර් 31 දිනට රු.2,725,113 ක් විය. එම මුදල් භාවිතා කිරීම සඳහා මුදල් පොතට ගතහැකිව තිබුණද, ඒ අනුව කටයුතු නොකර නිෂ්කාර්යව පවත්වාගෙන ගොස් තිබුණි.	එම තැන්පත් මුදල් පොතට ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන බව.	නිෂ්කාර්යව පැවති කාළයට අදාලව සභා අරමුදලට වූ අලාභය නිශ්චය කර අයකර ගැනීමට හා ඉදිරියේදී භාවිතයට ගැනීමට හෝ ආයෝජන කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	සභාවේ ජංගම ගිණුමේ රු.60,000,000 කට වැඩි මුදල් 2024 වර්ෂය පුරා නිෂ්කාර්යව පැවතුණි. මෙම මුදල් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කලේ නම් වාර්ෂිකව සියයට 11 ක පොලියක් හෙවත් රු.6,600,000 ක පොළී ආදායමක් සභා අරමුදලට අහිමි වී තිබුණි.	මුදල් පොතේ පවතින ශේෂය ස්ථිර තැන්පත් දැමීම සඳහා ඉදිරි කටයුතු කරන බව.	මහජන මුදල් උපරිම කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතුය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්, බිල් කළ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2024				2023			
ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස් කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස් කළ ආදායම	දෙසැම්බර් 31 දිනටමුළු හිඟය
	රු.'000	රු.'000	රු.'000	රු.'000	රු.'000	රු.'000	රු.'000	රු.'000
වරිපනම් හා බදු	20,470	20,330	18,248	15,849	19,000	18,866	16,900	12,109
කුලී	33,615	23,220	38,248	5,244	67,006	22,417	21,298	3,072
බලපත්‍ර ගාස්තු	921	400	1,442	277	901	367	442	204
වෙනත් ආදායම්	32,304	-	21,891	7,891	31,525	11,610	11,610	9,425
	87,310	43,950	79,829	29,261	118,432	53,260	50,250	24,810

2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත මුලු ආදායමෙන් බිල් කීරීම සියයට 50 ක් පමණ වූ අතර රැස්කළ ආදායම සියයට 69 ක් පමණ විය. මේ නිසා මුලු ආදායම ඇස්තමේන්තු කිරීම තාත්වික බවක් නිරීක්ෂණය නොවිය.	ඇස්තමේන්තුගත ආදායම ඇස්තමේන්තුවක් මත හා බිල්කළ ආදායම සමීක්ෂණයක් මත පදනම් වන බව.	මුලු ආදායම ඇස්තමේන්තු කිරීම තාත්විකව සිදු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට කාල විශ්ලේෂණ වාර්ථාව අනුව රු.15,710,560 ක් වූ මුළු හිඟ වරිපනම් ශේෂයෙන් වර්ෂ 05 ට වැඩි ශේෂය රු.5,264,509 ක්ද, වර්ෂ 2 ත් 3 ත් අතර ශේෂය රු. 3,825,940 ක් සහ වර්ෂ 01ට අඩු ශේෂය රු.6,620,111 ක්ද වශයෙන් සභාවට අයවිය යුතුව පැවතුණි.	හිග වරිපනම් දේපල පිළිබද සමීක්ෂණයක් සිදු කරමින් පවතින බව.	හිඟ ආදායම් අය කිරීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණක් පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාවේ අයවැයගත කසල ගාස්තු ප්‍රමාණය රු. 2,300,000 ක් වූ අතර වර්ෂයේ තත්‍ය රැස්කර ගැනීම රු.1,230,000 ක් වූයෙන් අයවැය හා සැසදීමේදී රැස්කිරීමේ ප්‍රගතිය සියයට 53 ක් පමණ විය. සභාව දිරන කසල කිලෝ ග්‍රෑම් 233,801 ක් සහ නොදිරන කසල කිලෝ ග්‍රෑම් 99,500 ක් වාර්ෂිකව රැස්කර තිබුණද එම කසල සම්පතක් ලෙස නොසලකා බැහැර කර තිබුණි.	කසල වලින් ආදායම් ඉපයීමකට වඩා කසල කළමනාකරණය කිරීම සදහා ප්‍රමුඛතාවය ලබාදී ඇති බව.	කසළ නිසිපරිදි බැහැර කිරීමට සහ එමගින් ලබාගත හැකි ආදායම් සහා අරමුදලට ලබාගැනීමට කටයුතු කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	නව පොදු වෙළඳ සංකීර්ණයෙහි උඩු මහලෙහි ඉදිකර ඇති රැස්වීම් ශාලාව වරලත් තක්සේරු කරුවෙකුගේ තක්සේරුවකින් තොරව රු.30,000 ක මාසික කුලියකට බාහිර පාර්ශවයකට වර්ෂ 03 ක කාලයක් සඳහා 2023 නොවැම්බර් මස සිට ලබා දී තිබුණි.	මාසිකව රු.30,000 ක මුදලකට තක්සේරු කර කුලියට දීමට තීරණය කර ඇති බව.	වරලත් තක්සේරු කරුවකු ලවා තක්සේරුව සිදුකළ යුතුය.

(ආ)	ටෙන්ඩර් කොන්දේසි අනුව ආපසු ගෙවනු ලබන ආරක්ෂිත ඇප තැන්පත් මුදල එකවර ගෙවිය යුතු වුවත් ශාරිරීක යෝගාතා මධාස්ථානයට අදාළ රු.153,000 ක් වූ ආරක්ෂිත ඇප තැන්පතුවෙන් රු.75,000 ක් පමණක් ගෙවීම් සිදුකර ඉතිරිය කොටස් වශයෙන් ගෙවීම් කිරීමට අවස්ථාව ලබාදී තිබුණි.	මුළු කුලී ආරක්ෂිත මුදලම ලබාගෙන ඇති බව.	ලංසු කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	සභාව විසින් වාර්ෂිකව ටෙන්ඩර් ලබා දෙනු ලබන දේපල 21 න් දේපල 07 ක් සමාලෝචිත වර්ෂය තුල බදු දීමට කටයුතු කර නොතිබුණි.	සභාව සතු දේපල 07 ක් බදු ලබාදීමට නොහැකි වී ඇති බව.	සභාව විසින් වාර්ෂික ටෙන්ඩර් දේපළ බදු ලබා දී ආදායම් ඉපයීමට කටයුතු කළ යුතුය.

3.3 අවිධිමත් ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 සැප්තැම්බර් 21 දින සිට වර්ෂයකට සියයට 8.75 ක පොළී අනුපාතයකට මහජන බැංකුවේ රු. මිලියන 05 ක ස්ථාවර තැන්පතුවක් කල්පිරෙන දිනයක් රහිතව පවත්වාගෙන ගොස් තිබුණි.	විගණනයෙන් පෙන්වා දුන් පරිදි වඩාත් ප්‍රතිලාභ ලැබෙන ආකාරයට ආයෝජනය කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	මහජන මුදල් උපරිම කාර්යක්ෂමව යෙදවීමට ක්‍රියා කළ යුතුය.
(ආ)	2021 වර්ෂයේදී සියයට 3.75 ක පොළී අනුපාතයක පැවති රු. මිලියන 05 ක මුදල 2023 සැප්තැම්බර් 07 දින සත්දින තැන්පතුවකට මාරු කිරීමට තීරණය කර තිබුණි.	විගණනයෙන් පෙන්වා දුන් පරිදි වඩාත් ප්‍රතිලාභ ලැබෙන ආකාරයට ආයෝජනය කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	මහජන මුදල් උපරිම කාර්යක්ෂමව යෙදවීමට ක්‍රියා කළ යුතුය.

3.4 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තත්‍ය සේවක සංඛ්‍යාව අනුව ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 02 ක්ද ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 11 ක්ද ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 06 ක් ද වශයෙන් පුරප්පාඩු 19 ක් පැවතුණි.	මේ පිළිබඳ දිගින් දිගටම දැනුම් දීම් සිදුකර ඇති බව.	කාර්ය මණ්ඩල කළමනාකරණය කර ජනතාවට උපරිම සේවයක් ඉටු කිරීමට ක්‍රියා කළ යුතුය.

3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිකර සභාව වෙත භාරදී තිබූ බස් නැවතුම්පල ඉදිරිපිට නව වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා සභාව මැදිහත්වීම අවමවීම හා අවශ්‍යතාවයට අනුව ඉදිකිරීම් කර නොතිබීම සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.		
(i)	නව වෙළඳ සංකීර්ණය ඉදිකිරීම අදියර කිහිපයකින් සිදුකර තිබූ අතර එහි ඉදිකිරීම් සම්පූර්ණ කිරීමට පෙර කොටස් වශයෙන් සභාව විසින් භාරගෙන එහි වූ කඩ කාමර බදුකරුවන් වෙත ලබාදී තිබුණි. ඒ අනුව බාහිර පාර්ශවයක් විසින් ඉදිකරන ලද ගොඩනැගිල්ල සම්පූර්ණ කර භාර දෙන තෙක් නොසිට පරිහරණයට ගෙන තිබීම.	බදුකරුවන් සමග නව තක්සේරු වටිනාකම මත ගිවිසුම්ගත වීමට තීරණය කර ඇති බව.	ඉදිකිරීම් අවසන් වූ පසු විධිමත් පරිදි සභාවට භාරගෙන බදු ලබාදීම සිදුකළ යුතුය.
(ii)	ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාල මූලික සාකච්ඡා සඳහා සභාව සම්බන්ධවීමක් නොවීමෙන් නිවැරදි සැලැස්මකට අනුව ඉදිකර නොතිබූ නිසා තුන්වන මහලේ කඩ කාමර බදුකරුවන් විසින් වසා දමා තිබුණි. සෑම මහලක් සඳහාම කඩ හිමියන්ට අවශ්‍ය පොදු පහසුකම් ලබාදී නොතිබූ අතර ඉදිකිරීම් හා සැලසුම්වල දුර්වලතාවයන් මත වතුර ටැංකි පවතින ස්ථානය ආසන්නයේ වෙළඳ සංකීර්ණයේ වැසිකිළි පද්ධතියට අදාල ගලිවලවල් නිතරම උතුරායාමක් සිදුවන බවට පැමිණිලි ලැබී තිබුණි. සභාව විසින් සභාවේ දේපලක ඉදිකරන ලද ගොඩනැගිල්ල නිසි ප්‍රමිතියකින් සකස්කර ගැනීමට කටයුතු සිදු නොකිරීම විගණනයට ගැටළුකාරී විය.	සැලැස්මෙහි පොදු පහසුකම් ස්ථාපනය කර නොමැති බව.	බදු ලබාදීමට පෙර පොදු පහසුකම් ස්ථාපනය කරගැනිමට කටයුතු කළ යුතුය.
(ආ)	මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් විමධ්‍යගත අයවැය වැඩ සටහන- 2024 යටතේ බහු කාර්ය ගොඩනැගිල්ලක් ඉදි කිරීමට අනුමත වූ ව්‍යාපෘතිය 2024 අප්‍රේල් මස දක්වා ඉදිරි කටයුතු සිදු නොකර කාලය ගත වූ පසු හදිස්සි කටයුත්තක් සේ සලකා සැලැස්ම සකසා ගැනීමට ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් උපදේශන සේවාවන් පත් කර නොගෙන සෘජු ක්‍රමයට සැලසුම් ශිල්පියෙකු තෝරාගෙන තිබුණි. සුදුසු සැලැස්මක් සකස් කර කඩිනමින් ලබා දෙන ලෙසත් දැනුම් දී තිබුණ ද සභාව විසින් කාර්යය අවසන් කර භාර දිය යුතු දිනය, සේවා කොන්දේසි ආදි තොරතුරු ඇතුලත් කරමින් එම උපදේශකයා සමග විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි.	මුදල් අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති MF/02/20 යටතේ 2024 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ අනුමත වූ ව්‍යාපෘති 2024 ජුලි 31 ට පෙර අවසන් කළ යුතු බව දන්වා ඇති බව.	ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුව උපදේශකයකු තෝරාගෙන එම ආයතනය සමඟ ගිවිසුම්ගතවී ව්‍යාපෘති ඉටුකළ යුතුය.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

4.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2019 දෙසැම්බර් 24 දින අතිවිශේෂ ගැසට්පත්‍ර අංක 2155/7 හි සඳහන් නගර සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති 8 අනුව ඊලඟ මුදල් වර්ෂයේ සඳහා වන ගිණුම අනුගාමී මුදල් වර්ෂයන්හි පෙබරවාරි 28 දින හෝ එදිනට පූර්වයෙන් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ දින 69 ක ප්‍රමාදයකින් පසුව 2025 මැයි 08 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	රීති අනුව නියමිත දිනට ගිණුම ඉදිරිපත් කළ යුතුය.